# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1639/27 - 2010 පෙබරවාරි 05 වැනි සිකුරාදා - 2010.02.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත**

3 (6) (අ) සහ (ආ) වගන්තිය යටතේ නියමය

2001 අංක 02 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන ) පනතින් සංශෝධිත 1983 අංක 24 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 3(6) (අ) සහ (ආ) වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අවසන් වශයෙන් තවත් එක් වරක් පමණක් මනාපය ප්‍රකාශ කිරීමේ කාලය දීර්ඝ කිරීමට රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය සරත් එල්. බී. අමුණුගම වන මම, මේ නියමයෙන්,

1. 1983.08.01 දිනට රාජ්‍ය සේවයේ සේවා නියුක්ත වූ නිලධාරිනියක් විසින් විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා මනාපය ප්‍රකාශ කිරීමට තීරණය කරනු ලැබිය හැක්කේ යම් දිනයකට පෙරද, එම දිනය 2010.06.30 ලෙස ද,

2. නිලධාරිනිය විශ්‍රාම ලබා ඇත්නම් අයවිය යුතු හිඟ දායක මුදල් හා වැල් පොළිය වාරික 180 කින් අය විය යුතු බවද, එය විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2008 අනුකූල විය යුතු බවට ද,

3. තවද නිලධාරිනිය මියගොස් ඇත්නම් අදාල දායක මුදල හා පොළිය ප්‍රදානයෙන් එකවර අඩු කළ යුතු බවත්, නිලධාරිනිය සේවයේ යෙදී සිටින්නේ නම් ඇය විශ්‍රාම යාමට පෙර මුළු දායක මුදල හා පොළිය අයකළ යුතු බවත් නියම කරමි.

ආචාර්ය සරත් එල්. බී. අමුණුගම,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2010 ජනවාරි මස 28 වැනි දින,
කොළඹ 07,
නිදහස් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

02-477

1A - G 12402— 930 (2010/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.